පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

2023-10-04

පාර්ලිමේන්තුවේ මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**"වත්මන් රජයේ අදූරදර්ශී රාජ්‍ය පාලනය නිසා ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් වෘත්තිකයන් රට හැරයාමේ ප්‍රවනතාවය" සම්බන්ධයෙන් 2023-10-06 වන දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව**

රටේ ජීවත්වන වෘත්තිකයන් හා බුද්ධිමතුන් මෙරටින් බැහැරවීම පසුගිය සියවසේ මැද භාගයේ සිටම සිදුවුවත්, එම තත්ත්වය පසුගිය වසර කිහිපය තුළ කැපී පෙනෙන ලෙස ඉහළ අගයක් ගැනීම දැකිය හැකිය. මුල් කාලීනව රට හැර යාමට හේතු වූයේ රජයේ මැදිහත්වීමෙන් සිදුවූ අනන්‍යතාවයන් බැහැර කිරීම, නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම හා දේශපාලන අස්ථාවරත්වයයි.

වර්තමානයේ එම තත්ත්වය තීව්‍ර ලෙස වැඩිවී ඇත්තේ රජය විසින් ඇති කරන ලද ආර්ථික අර්බුදය, රජයේ දූෂණ හා අක්‍රමිකතාවල මිල බදු බර ලෙස වෘත්තිකයන් මත පැටවීමයි. එයින් නොනැවතී ජනතාවගේ විශ්‍රාමික අරමුදල් මත රජය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පිරිවැය ද පැටවීමට වත්මන් රජය කටයුතු කරන ලදී.

විශේෂයෙන්ම රටක සෞඛ්‍ය ක්ෂේත්‍රය එම රටවැසියන්ගේ ජීවත්වීමේ අයිතිය කියාපාන සාධකයක් වුවත්, එම ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයන් රට හැරයාම කැපී පෙනෙන ලෙස වැඩි වී ඇත. මේ හේතුව නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයම මුහුණ දී ඇති ගැටළු දිනපතා වාර්තා වන අතර, පාලකයන් මේ සම්බන්ධයෙන් දක්වන උදාසීනත්වය මෙම ගැටළු තව තවත් තීව්‍ර කිරීමට හේතු වී ඇත.

තවද, රජය සතු ව්‍යාපාර හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ඉංජිනේරුවන් හා ගණකාධිකාරිවරුන් ඇතුලු අනෙකුත් වෘත්තිකයන්ගේ හිඟයෙහි බලපෑම දැන් දැන් දැඩිව දැනේ. මීට අමතරව අධ්‍යාපන ක්ෂ්ත්‍රයේ හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ හිඟය හා පර්යේෂකයින්ගේ හිඟය ද කැපී පෙනේ. තවද විදේශ ආයෝජකයන් ආකර්ෂනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය බරපතල ගැටලුවලට මුහුණ පාමින් ඇත්තේ එහි ශ්‍රමිකයින් සීඝ්‍ර ලෙස රට හැර යාමයි. එමෙන්ම ගුවන් නියමුවන් හා ගුවන් සේවා ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තිකයන්ගේ හිඟය අද වන විට අර්බුදකාරී තත්ත්වයක් දක්වා වර්ධනය වී ඇත. එමෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් හා අධිකරණ ක්ෂේත්‍රයේ බුද්ධිමතුන් රටින් බැහැර වීමද සැලකිල්ලට ගත යුත්තකි.

වෘත්තිකයන් හා බුද්ධිමතුන් රට හැර යාම නිසා ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර අඩපනවීමට පමණක් නොව ආර්ථිකය නැවත යථා තත්ත්වයට ගැනීමේ වැයමට දැඩි අභියෝගයක් ඇති කරනු ඇත.

එබැවින් රටේ ඉදිරි අනාගතය සුරක්ෂිත කිරීමට බුද්ධිමත් මානව සම්පත් රැක ගැනීමේ සාධනීය වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවට මෙම සභාව යෝජනා කර සිටී.

ඉරාන් වික්‍රමරත්න
පාර්ලිමේන්තු මන්ත්‍රී